මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන්ට බරවාහන වෛද්‍ය සහතික නිකුත් නොකිරීමට ගත් තීරණය, ලංකාදීප සහ දිවයින පුවත් වාර්තාවන් තුළ (10/07) ආවරණය වී තිබිණි. එහිදී ලංකාදීප සිරස්තලය "මත්ලෝලීන්" යන යෙදුම භාවිතා කර තිබූ අතර, දිවයින සිරස්තලය "මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන්" යන යෙදුම භාවිතා කර තිබිණි.

මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් යනු සංකීර්ණ වූ කරුණු ගණනාවක් සමගින් සිදුවන්නකි. ඒ අනුව ගත් විට,මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් යනු හුදු මත්ද්‍රව්‍ය වෙත ලෝලත්වයක් දැක්වීමක් හෝ ලොල්වීමක් ලෙසින් දැක්වීම ඔස්සේ, මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වීම පිළිබඳවත්, මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වන්නන් පිළිබඳවත් වැරදි මතයක් සමාජගත විය හැක. එය ගැටළුකාරී නොවන්නේද?

"මත් ලෝලීන්" වැනි යෙදුම් වෙනුවට, දිවයින සිරස්තලයේ යොදාගෙන ඇති "මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන්" වැනි යෙදුමක් යොදාගත නොහැකිද?

මේ අතුරින් ඔබ තෝරාගන්නා සිරස්තලය කුමක්ද?

**#MediaEthicsSL #lka #sinhalanews #Lankadeepa #Divaina**